# අයදුම්කරුවන්ට උපදෙස්

- 2008 අංක 1 දරණ මාදක ඖෂධ හා මනෝවර්තක නීති විරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත යටතේ පිහිටුවා ඇති පුරෝගාමී පාලන අධිකාරිය මගින් එම පනතේ බලතල හා කාර්යයන් ඉටු කරනු පිණිස 2011 ජනවාරි මස 01 වෙනි දින සිට බලපත්‍ර හා ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කරනු ලැබේ.

- එම පනතේ පළමු උපලේඛනයේ I හා II වගු යටතේ වර්ගීකරණය කර ඇති රසායන ද්‍රව්‍ය 23ක් සඳහා මෙම බලපත්‍ර නිකුත් කරනු ලබන අතර එම රසායන ද්‍රව්‍ය ලැයිස්තුව හා බලපත්‍ර වර්ග පහත සඳහන් කර ඇත.

### රසායන ද්‍රව්‍ය ලැයිස්තුව

| I වන වගුව | II වන වගුව |
|---|---|
| 1. ඇසිටික් ඇන්හයිඩ්‍රයිඩ් | 15. ඇසිටෝන් |
| 2. එන්.ඇසිටිලැන්ත්‍රනිලික් අම්ලය | 16. ඇන්ත්‍රනිලික් අම්ලය |
| 3. එපිහිඩ්‍රින් | 17. ඊතයිල් ඊතර් |
| 4. අර්ගොමෙට්‍රීන් | 18. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය |
| 5. අර්ගොට් ඇමීන් | 19. මෙතිල් එතිල්කීටෝන් |
| 6. අයිසොසැෆ්රෝල් | 20. ෆීනයිල් ඇසිටික් අම්ලය |
| 7. ලයිසර්ජික් අම්ලය | 21. පිපරිඩීන් |
| 8. 3,4-මෙතිලීන්ඩයොක්සිෆීනයිල් | 22. සල්ෆියුරික් අම්ලය |
| 9. නෝර්එප්ඩ්‍රින් | 23. ටොලූර්න් |
| 10. 1-ෆීනයිල්-2-ප්‍රොපනෝන් | |
| 11. පිපරනැල් | |
| 12. පොටෑසියම් පර්මැන්ගනේට් | |
| 13. ප්සියුඩොඑෆඩ්‍රින් | |
| 14. සැෆ්රෝල් | |
| • හයිඩ්‍රොක්ලෝරික් අම්ලයේ සහ සල්ෆියුරික් අම්ලයේ හැර ලැයිස්තු ගත කර ඇති ද්‍රව්‍ය වල ලවණ ඒ ලවණ තිබීමට ඉඩ ඇති ඕනෑම අවස්ථාවක දී | |

### බලපත්‍ර වර්ග

(i) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනකරුවන් හා අපනයනකරුවන් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය

(ii) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ගබඩා කරන පරිශ්‍ර සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය

(iii) පුරෝගාමී රසායන ද්‍රව්‍ය වෙළඳුන් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය

(iv) පුරෝගාමී රසායන ද්‍රව්‍ය අවසන් භාවිතකරන්නන් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය

## (i) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ආනයනකරුවන් හා අපනයනකරුවන් සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රය

**(1 ආකෘතිය - බලපත්‍ර නිකුත් කිරීම)**

**ලේඛනගත ද්‍රව්‍ය සඳහා බලපත්‍ර ගාස්තුව රු. 5000/-**

- ඉහත සඳහන් කර ඇති රසායන ද්‍රව්‍ය 23 ට අයත් යම් ද්‍රව්‍යයක් ආනයනය හෝ අපනයනය කිරීමට අදහස් කරන සෑම තැනැත්තෙකුම විසින් ඒ ව්‍යාපාරයට සම්බන්ධවීමට මාස දෙකකට පෙරාතුව (1) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග පුරෝගාමී පාලන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- අදාල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ද එම ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

- එම ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට මසක් ඇතුලත අධිකාරිය විසින් බලපත්‍රය නිකුත් කරනු ලබන අතර එම බලපත්‍රය නිකුත් කල දින සිට වසරක කාලයක් සඳහා වලංගු වේ.

**(11 ආකෘතිය - බලපත්‍ර සංශෝධනය කිරීම)**

**බලපත්‍ර සංශෝධන ගාස්තුව රු. 2000/-**

- බලපත්‍රලාභී ආනයනකරුවෙකු හෝ අපනයනකරුවෙකු වෙත නිකුත් කර ඇති බලපත්‍රයෙන් ආවරණය නොවන ඉහත කී ද්‍රව්‍ය 23 ට අයත් යම් ද්‍රව්‍යයක් ආනයනය හෝ අපනයනය කිරීමට අරමුණු කරන අවස්ථාවක දී එම අලුත් ද්‍රව්‍ය පිළිබඳව කටයුතු කිරීමට පෙර, මසකට නොඅඩු කාලසීමාවක් තුල, (11) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග බලපත්‍රය සංශෝධනය කිරීම සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- එවැනි ඉල්ලුම්පත්‍රයක් ලද දිනයේ සිට සති දෙකක් අතුලත අධිකාරිය විසින් බලපත්‍රය සංශෝධනය කරනු ලබයි.

- සෑම සංශෝධිත බලපත්‍රයක්ම එය නිකුත් කල දිනයේ සිට කලින් නිකුත් කර ඇති මුල් බලපත්‍රය අවලංගු වන දිනය දක්වා වලංගුවේ.

**(111 ආකෘතිය - බලපත්‍ර අලුත් කිරීම)**

**බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව රු. 4500/-**

- සෑම ආනයනයකරුවෙකු හෝ අපනයනකරුවෙකු වෙත නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක්ම වාර්ෂිකව අලුත් කල යුතුය.

- සෑම බලපත්‍රලාභී ආනයනකරුවෙකු හෝ අපනයනකරුවෙකු විසින්ම බලපත්‍රය නිකුත් කරනු ලැබූ දින සිට හෝ එහි යම් අලුත් කිරීමක් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත්වීමට

මසකට පෙරාතුව මෙම (111) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග බලපත්‍රය අලුත් කරවා ගැනීම පිණිස අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- එවැනි ඉල්ලුම්පත්‍රයක් ලද දිනයේ සිට සති දෙකක් ඇතුලත, අධිකාරිය විසින් වසරක ඉදිරි කාල සීමාවක් සඳහා බලපත්‍රය අලුත් කරනු ලැබේ.

### (I), (II) සහ (III) ආකෘති වලට අයත් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

- ආනයනකරුවන් හා අපනයනකරුවන් විසින්
  (අ.) අදාල ආකෘතිවලට අනුව ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව හෝ
  (ආ.) ඒ කටයුතු කරගෙන යන ආකාරය පිළිබඳව
  අධිකාරිය අතෘප්තියට පත් වූ අවස්ථාවක අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කරනු නොලැබේ.

- එවන් අවස්ථාවලදී බලපත්‍රය නිකුත් නොකිරීමට හේතු ඉල්ලුම්කරුට දන්වනු ලබන අතර ඒ පිළිබඳව අධිකාරිය වෙත කරුණු දැක්වීමට ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබා දේ.

### ආනයනකරුවන් හා අපනයනකරුවන් සඳහා වූ බලපත්‍ර අවලංගු කිරීම

- (ආ.) පනතේ යම් විධි විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් කොන්දේසියකට යටත්ව බලපත්‍රය නිකුත් කරන ලද්දේ නම්, එකී යම් කොන්දේසියක් උල්ලංඝනය කරනු ලැබූ විටක නැතහොත් අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූල වී නොමැති අවස්ථාවක දී හෝ
  (ආ.) අධිකාරිය වෙත ඉදිරිපත් කල යම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය වන හෝ අදාල දත්ත කිසිවක් සඟවා ඇති අවස්ථාවක
  බලපත්‍රය අවලංගු කිරීමට අධිකාරියට හැකිය.

- එසේ වුවද අධිකාරිය විසින් බලපත්‍රය අවලංගු කිරීමට පෙරාතුව බලපත්‍රලාභියාට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදේ.

- ඒ අනුව බලපත්‍රය අවලංගු කරනු ලැබුවේ යම් තැනැත්තෙකු ගේ ද එම බලපත්‍රය අවලංගු කිරීමේ දින සිට වසර 2 ක කාලසීමාවක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් එම තැනැත්තා හට නව බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කල හැකිය.

## (ii) පුරෝගාමී රසායන ද්‍රව්‍ය ගබඩා කරන පරිශ්‍ර සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය

### (IV ආකෘතිය - පරිශ්‍ර සඳහා ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම)

### පරිශ්‍ර ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 5000/-

- සෑම බලපත්‍රලාභී ආනයන හෝ අපනයනකරුවෙකු විසින්ම ආනයනය හා අපනයනය සඳහා වූ බලපත්‍රය නිකුත් කළ දින සිට මාසයක් ඇතුලත ඉහත සඳහන් කර ඇති රසායන ද්‍රව්‍ය 23 ට

අයත් යම් ද්‍රව්‍යයක් ආනයනය හෝ අපනයනය කිරීමට අදාල වන කාර්යයන් කරගෙන යන්නා වූ පරිශ්‍රයන් ද අධිකාරිය සමග ලියාපදිංචි කළ යුතුය.

- පරිශ්‍රයන් ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, ආනයනය හෝ අපනයනය සඳහා වූ බලපත්‍රය නිකුත් කළ දින සිට සති දෙකක කාලයක් තුල (IV) ආකෘතියට අනුව අදාල ගාස්තුව සමග අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.
- තවද මධ්‍යම පරිසර අධිකාරිය මගින් අදාල පරිශ්‍රය වෙත නිකුත් කර ඇති නිෂ්කාශනයේ පිටපතක්ද ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.
- එම ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට සති දෙකක් ඇතුලත අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන අතර එම සහතිකය නිකුත් කල දින සිට වසරක කාලයක් සඳහා වලංගු වේ.

### (IV ) ආකෘතියට අයත් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

- ඉහත සඳහන් (IV) ආකෘතියට අනුව යොමු කරන ලද ඉල්ලුම් පතක්
  (අ.) ආනයන හෝ අපනයනකරු විසින් ඉල්ලුම්පතේ සඳහන් කරන ලද තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව හෝ
  (ආ.) ආනයනකරු හෝ අපනයනකරු විසින් කරගෙන යන්නා වූ ආශ්‍රිත කාර්යයන් කෙරෙන ආකාරය පිළිබඳව
  අධිකාරිය අතෘප්තියට පත් වූ අවස්ථාවක අධිකාරිය විසින් කිසිදු පරිශ්‍රයක් ලියාපදිංචි නොකරනු ලැබේ.

- එවන් අවස්ථාවලදී ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් නොකිරීමට හේතු ඉල්ලුම්කරුට දන්වනු ලබන අතර ඒ පිළිබඳව අධිකාරිය වෙත කරුණු දැක්වීමට ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබාදේ.

<u>බලපත්‍රලාභී ආනයනකරුවන්ගේ හා අපනයනකරුවන්ගේ කාර්යයන්</u>

### 1. අධීක්ෂණ හා පරීක්ෂණ කටයුතු සඳහා සහය දැක්වීම

- අධිකාරියේ සාමාජිකයන් විසින් අවම වශයෙන් මාස 03 කට වරක්වත් බලපත්‍රලාභියාගේ ලියාපදිංචි කරනු ලැබූ පරිශ්‍රයට පැමිණ ඉහත සඳහන් රසායන ද්‍රව්‍ය භාවිත කරමින් කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණය කරනු ලැබේ.
- මීට අමතරව අධිකාරියේ සාමාජිකයන් විසින් එම රසායන ද්‍රව්‍ය ගබඩා කර ඇති ආකාරය පිළිබඳවද, අදාල සියලු උපකරණ භාවිතය පිළිබඳව ද, බලපත්‍රලාභියා විසින් පවත්වාගෙන යනු ලබන පොත්, ලේඛණ, රෙජිස්ටර් හා වාර්තා පිළිබඳව ද පරීක්ෂා කරනු ලැබේ.

- අධිකාරිය විසින් බලපත්‍රලාභියාගේ ක්‍රියාකාරකම් පිළිබඳ විමසා බලනු ලබන අතර, ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ඉල්ලා සිටීම හා අවශ්‍ය අවස්ථාවලදී ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමද කරනු ලැබේ.

## 2. ත්‍රෛමාසික වාර්තා ඉදිරිපත් කිරීම

## (V ආකෘතිය - ත්‍රෛමාසික වාර්තා )

- සෑම බලපත්‍රලාභී ආනයනයකරුවෙකු හෝ අපනයනකරුවෙකු විසින්ම ඉහත සඳහන් කර ඇති ද්‍රව්‍ය 23 ට අයත් ද්‍රව්‍යයන් ආනයනය, අපනයනය, භාවිතය, නිෂ්පාදනය සහ බෙදාහැරීම පිළිබිඹු කෙරෙන ත්‍රෛමාසික වාර්තා අධිකාරිය වෙත භාර දිය යුතුය.

- පළමු ත්‍රෛමාසික වාර්තාව බලපත්‍රය නිකුත් කළ දින සිට මාස 03ක් ඇතුලත අධිකාරිය වෙත භාර දිය යුතුය.

### බලපත්‍ර අවලංගු කිරීම

- බලපත්‍රලාභියා විසින්
  (අ.) ත්‍රෛමාසික වාර්තා භාර දිම පැහැර හැර ඇති බව හෝ
  (ආ.) අධිකාරියට අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ
  (ඇ.) අදාල තොරතුරු ලබා දී නොමැති බව
  අධිකාරියට පෙනී යන අවස්ථාවක දී ඒ තැනැත්තාගේ බලපත්‍රය අවලංගු කිරීමට අධිකාරියට හැකිය.

## 3.රසායන ද්‍රව්‍ය බෙදාහරින තැනැත්තන් ලියාපදිංචි කිරීම

- බලපත්‍රලාභී ආනයනකරුවකු විසින් ඉහත සඳහන් කර ඇති ද්‍රව්‍ය 23 ට අයත් යම් ද්‍රව්‍යයක්, ආනයනකරු සමග ලියාපදිංචි වී ඇති තැනැත්තෙකුට මිස කිසිදු තැනැත්තෙකුට විකිණීම හෝ ලබාදීම නොකළ යුතුය.

- පහත දැක්වෙන තොරතුරු ඇතුලත් රෙජිස්ටරයක් සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු විසින්ම පවත්වාගෙන යා යුතුය.

| ආනයනකරුගෙන් ඉහත කී ද්‍රව්‍ය මිලට ගත් හෝ ලබාගත් තැනැත්තන්ගේ නම් | ද්‍රව්‍ය වල නම් | විකුණන ලද, දෙන ලද හෝ ලබාගත් ප්‍රමාණය | මිලට ගත්, දෙන ලද, ලබාගත් ඉහත කී ද්‍රව්‍යවලින් වන කාර්යයන් පිළිබඳ තොරතුරු |
|---|---|---|---|
| | | | |

## 4. මධ්‍යම පරිසර අධිකාරියේ නිෂ්කාශනය

- ඉහත සඳහන් කර ඇති ද්‍රව්‍ය ආනයනය හෝ අපනයන තරන සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම අවසන් භාවිත කරන්නන්ට සිල්ලරට විකිණීම හැර ගබඩාකිරීමේ හා බැහැර කිරීමේ කාර්යයන් සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් නිෂ්කාශනයක් ලබා ගත යුතුය.

**5. අධිකාරිය වෙත නොපමාව අදාල තොරතුරු සැපයීම**

- සෑම බලපත්‍රලාභී ආනයනකරුවකු හෝ අපනයනකරුවකු විසින්ම ඉහත සඳහන් කර ඇති රසායන ද්‍රව්‍ය 23 ට අයත් ද්‍රව්‍ය ලියාපදිංචි පරිශ්‍රවල ගබඩා කර ආරක්ෂා කරන බවට සහතික විය යුතු අතර, එම ද්‍රව්‍ය වලට අදාලව කිසියම් සොරකමක්, විස්තර කල නොහැකි පාඩුවක් හෝ සැක කටයුතු කාර්යයක් පිළිබඳව පූරෝගාමී පාලන අධිකාරිය වෙත හෝ වෙනත් යම් සුදුසු අධිකාරියක් වෙත නොපමාව දැනුම් දිය යුතුය.

**බලපත්‍ර අවලංගු කිරීම**

- ඉහත අංක 3, 4 හා 5 යටතේ දක්වා ඇති නියෝග උල්ලංඝනය කරන බලපත්‍රලාභියකු සම්බන්ධයෙන් අධිකාරිය විසින්, මෙම පනත යටතේ පනවන ලද වෙනත් නෛතික ප්‍රතිඵලයන්ට අමතරව ඒ තැනැත්තාගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැක.

- එසේ වුවද අධිකාරිය විසින් බලපත්‍රය අවලංගු කිරීමට පෙරාතුව බලපත්‍රලාභියාට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දේ.

## <u>(iii) පූරෝගාමී රසායන ද්‍රව්‍ය වෙළඳුන් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය</u>

**(VI ආකෘතිය - ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම)**
**වෙළෙඳුන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 4000/-**

- ඉහත සඳහන් කර ඇති ද්‍රව්‍යයන් තොග හෝ සිල්ලර වශයෙන් විකිණීමට අදහස් කරනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම (VI) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග පූරෝගාමී පාලන අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.

- අදාල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ද එම ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය.

- එම ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට මසක් ඇතුලත අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලබන අතර එම සහතිකය නිකුත් කල දින සිට වසරක කාලයක් සඳහා වලංගු විය යුතුය.

**(VII ආකෘතිය - ලියාපදිංචි කිරීමේ සහතිකය සංශෝධනය කිරීම)**
**වෙළෙඳුන් ලියාපදිංචි කිරීම සංශෝධනය කිරීමේ ගාස්තුව රු. 1500/-**

- ලියාපදිංචි වෙළෙන්දෙකු වෙත නිකුත් කර ඇති සහතිකයෙන් ආවරණය නොවන ඉහත කී රසායන ද්‍රව්‍ය 23 ට අයත් යම් ද්‍රව්‍යයක් වෙළඳාම් කිරීමට පෙර මසකට නොඅඩු කාලසීමාවක් තුල (VII) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයේ අදාල ගාස්තුව සමග ලියාපදිංචි කිරීමේ සහතිකය සංශෝධනය කිරීම සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට සති දෙකක් ඇතුලත අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය සංශෝධනය කරනු ලබයි.

- සෑම සංශෝධිත බලපත්‍රයක්ම එය නිකුත් කල දිනයේ සිට කලින් නිකුත් කර ඇති මුල් ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු වන දිනය දක්වා වලංගුවේ.

**(VIII ආකෘතිය - ලියාපදිංචි කිරීමේ සහතික අලුත් කිරීම)**
**වෙළෙඳුන් ලියාපදිංචි කිරීම අලුත් කිරීමේ ගාස්තුව රු. 3500/-**

- සෑම ලියාපදිංචි වෙළෙන්දෙකු විසින්ම ඔහුගේ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කරවා ගත යුතුය.

- ඒ සඳහා ලියාපදිංචි කිරීමේ දින සිට හෝ එහි යම් සංශෝධනයක් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත් වීමට මසකට පෙරාතුව මෙම (VIII) ආකෘතියට අනුව ඉල්ලුම් පත්‍රයක් අදාල ගාස්තුව සමග අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට සති දෙකක ඇතුලත වසරක ඉදිරි කාල සීමාවක් සඳහා ලියාපදිංචිය අලුත් කරනු ලැබේ.

**(VI), (VII) සහ (VIII) ආකෘති වලට අයත් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම**

- වෙළෙඳුන් විසින් යොමු කරන ලද ඉල්ලුම්පත්‍ර
  (අ.) අදාල ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව හෝ
  (ආ.) කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් වල ආකාරය පිළිබඳව
  අධිකාරිය අතෘප්තියට පත් වූ අවස්ථාවක අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු නොලැබේ.

- එවන් අවස්ථාවලදී එම සහතිකය නිකුත් නොකිරීමට හේතු, ලිඛිතව ඉල්ලුම්කරුට දන්වනු ලබන අතර ඒ පිළිබඳව අධිකාරිය වෙත කරුණු දැක්වීමට ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබාදේ.

**<u>ලියාපදිංචි වෙළෙඳුන්ගේ කාර්යයන්</u>**

**1. රසායන ද්‍රව්‍ය බෙදාහරින තැනැත්තන් ලියාපදිංචි කිරීම**

- ලියාපදිංචි වෙළෙන්දෙකු විසින් ඉහත සඳහන් කර ඇති ද්‍රව්‍ය 23 ට අයත් යම් ද්‍රව්‍යයක්, එම වෙළෙන්දා සමග ලියාපදිංචි වී ඇති තැනැත්තෙකුට මිස කිසිදු තැනැත්තෙකුට විකිණීම හෝ ලබාදීම නොකළ යුතුය.

- පහත දැක්වෙන තොරතුරු ඇතුලත් රෙජිස්ටරයක් සෑම බලපත්‍රලාභී වෙළෙන්දෙකු විසින්ම පවත්වාගෙන යා යුතු අතර අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවකදී අධිකාරිය වෙත එම වාර්ථා ඉදිරිපත් කල යුතුය.

| ඉහත කී ද්‍රව්‍ය මිලට ගත් හෝ ලබා ගත් තැනැත්තන්ගේ හෝ භාවිතකරුවන්ගේ නම සහ ලිපිනය | ඉහත කී ද්‍රව්‍යයන්ට අදාලව කරගෙන යන්නා වූ ක්‍රියාකාරකම් | ක්‍රියාකාරකම් කරගෙන යන්නා වූ ස්ථාන වලට අදාල තොරතුරු | එකී ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කරන ද්‍රව්‍ය වල ප්‍රමාණය |
|---|---|---|---|
| | | | |

**වෙළඳුන් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතික අවලංගු කිරීම**

- ඉහත කී නියෝගය උල්ලංඝනය කරන ලියාපදිංචි වෙළෙන්දෙකු සම්බන්ධයෙන් අධිකාරිය විසින්, මෙම පනත පනවන ලද වෙනත් නෛතික ප්‍රතිඵලයන්ට අමතරව ඒ තැනැත්තාගේ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබිය හැක.

- (අ) පනතේ යම් විධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් කොන්දේසියකට යටත්ව ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරන ලද්දේ නම් එකී යම් කොන්දේසියක් උල්ලංඝනය කරනු ලැබූ විටෙක හෝ අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූල වී නොමැති අවස්ථාවක දී හෝ

  (ආ) අධිකාරිය වෙත ඉදිරිපත් කල යම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය වන අවස්ථාවක හෝ අදාල යම් දත්ත සඟවා ඇති අවස්ථාවක
  ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීමට අධිකාරියට හැකිය.

- ඒ අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබුවේ යම් තැනැත්තෙකුගේ ද එම අවලංගු කිරිමේ දින සිට වසරක කාල සීමාවක් ඉකුත් වීමෙන් පසුව පමණක් එම තැනැත්තා හට බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කල හැකිය.

## <u>(iv) පුරෝගාමී රසායන ද්‍රව්‍ය අවසන් භාවිතකරන්නන් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතිකය</u>

**(IX ආකෘතිය - ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම)**
**අවසන් භාවිත කරන්නන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 1500/-**

- ඉහත සඳහන් කර ඇති ද්‍රව්‍ය 23 ට අයත් ද්‍රව්‍යයක් භාවිත (නිෂ්පාදන කටයුතු සඳහා හෝ පර්යේෂණ කටයුතු සඳහා) කිරීමට අදහස් කරනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම (IX) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග පුරෝගාමී පාලන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- අදාල ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ද එම ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය

- එම ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට මසක් ඇතුලත අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලබන අතර එම සහතිකය නිකුත් කල දින සිට වසරක කාලයක් සඳහා වලංගු විය යුතුය.

**(X ආකෘතිය - ලියාපදිංචි කිරීමේ සහතික සංශෝධනය කිරීම)**

**අවසන් භාවිත කරන්නන් ලියාපදිංචි කිරීම සංශෝධනය කිරීමේ ගාස්තුව රු. 500/-**

- නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකයෙන් ආවරණය නොවන ඉහත කී ද්‍රව්‍ය 23 ට අයත් යම් ද්‍රව්‍යයක් භාවිත කිරීමට අදහස් කරන අවසන් භාවිත කරන්නෙකු විසින් අලුතෙන් එම ද්‍රව්‍ය භාවිත කිරීමට මාසයකට නොඅඩු කාලසීමාවක් තුල (X) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග ලියාපදිංචි කිරීමේ සහතිකය සංශෝධනය කිරීම සඳහා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

- තවද දැනට නිකුත් කර ඇති ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ද එම ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත්කළ යුතුය.
- ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට සති දෙකක් ඇතුලත අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය සංශෝධනය කරනු ලබයි.

- සෑම සංශෝධිත ලියාපදිංචි කිරීමේ සහතිකයක්ම එය නිකුත් කල දිනයේ සිට කලින් නිකුත් කර ඇති මුල් ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු වන දිනය දක්වා වලංගුවේ.

**(XI ආකෘතිය - ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම)**

**අවසන් භාවිත කරන්නන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තුව රු. 1000/-**

- සෑම ලියාපදිංචි අවසන් භාවිතකරුවෙකු විසින්ම ඔහුගේ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කර ගත යුතුය.

- ඒ සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට හෝ එහි යම් සංශෝධනයක් කරනු ලැබූ දින සිට වසරක කාලයක් ඉකුත් වීමට මසකට පෙරාතුව මෙම (XI) ආකෘතියට අනුව ඉල්ලුම්පත්‍රයක් අදාල ගාස්තුව සමග අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.

- ඉල්ලුම්පත්‍රය ලද දිනයේ සිට සති දෙකක් ඇතුලත වසරක ඉදිරි කාලසීමාවක් සඳහා ලියාපදිංචිය අලුත් කරනු ලැබේ.

## (IX), (X) සහ (XI) ආකෘති වලට අයත් ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

- අවසන් භාවිත කරන්නන්
  (අ.) අදාල ඉල්ලුම්පත්‍රයේ සපයන ලද තොරතුරු වල නිරවද්‍යතාවය පිළිබඳව හෝ
  (ආ.) කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් වල ආකාරය පිළිබඳව
  අධිකාරිය අතෘප්තියට පත්වූ අවස්ථාවක අධිකාරිය විසින් ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු නොලැබේ.

- එවන් අවස්ථාවලදී එම සහතිකය නිකුත් නොකිරීමට හේතු ලිඛිතව ඉල්ලුම්කරුට දන්වනු ලබන අතර ඒ පිළිබඳව අධිකාරිය වෙත කරුණු දැක්වීමට ඉල්ලුම්කරුට අවස්ථාවක් ලබාදේ.

## අවසන් භාවිත කරන්නන් සඳහා නිකුත් කරනු ලබන ලියාපදිංචි කිරීමේ සහතික අවලංගු කිරීම

- (අ) පනතේ යම් විධිවිධානයන් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යම් කොන්දේසියකට යටත්ව ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරන ලද්දේ නම් එකී යම් කොන්දේසියක් උල්ලංඝනය කරනු ලැබූ විටක හෝ අධිකාරිය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකට අනුකූල වී නොමැති අවස්ථාවක දී හෝ
  (ආ) අධිකාරිය වෙත ඉදිරිපත් කළ යම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය වන අවස්ථාවක හෝ අදාල යම් දත්ත සඟවා ඇති අවස්ථාවක
  ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීමට අධිකාරියට හැකිය.

- එසේ වුවද අධිකාරිය විසින් එම සහතිකය අවලංගු කිරීමට පෙරාතුව සහතිකලාභියාට ඒ පිළිබඳව කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දේ.

- ඒ අනුව ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබුවේ යම් තැනැත්තෙකුගේ ද එම අවලංගු කිරීමේ දින සිට වසර දෙකක කාල සීමාවක් ඉකුත් වීමෙන් පසුව පමණක් එම තැනැත්තා හට නැවත ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කල හැකිය.